Australian Government
Department of Home Affairs

# කෝවිඩ්-19 පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර

ඔබට වීසා බලපත්‍රයක් නැති වුවද, නැතිනම් ඔබගේ වීසා බලපත්‍ර තත්වය සම්බන්ධයෙන් පැහැදිලි නැතිවුවද, ඔබ විසින් මහජන සෞඛ්‍යය විධාන අනුගමනය කල යුතුය. ඔබට අසනීප නම්, වෛද්‍ය උපදෙස් ලබා කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කර ගන්න.

ප්‍රාන්ත සහ ටෙරිටරි රජයන් මගින් කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සහ ප්‍රතිකාර ලබාදීම සිදු කෙරේ.

- ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි
- නිව් සවුත් වේල්ස්
- නොදර්න් ටෙරිටරි
- ක්වීන්ස්ලන්ඩ්
- සවුත් ඕස්ට්‍රේලියා
- තස්මේනියා
- වික්ටෝරියා
- වෙස්ටර්න් ඕස්ට්‍රේලියා

### වික්ටෝරියා ප්‍රාන්තයේ සංක්‍රමණ සෞඛ්‍යය පරීක්ෂණ

තවදුරටත් ඇති කෝවිඩ්-19 සීමා හේතුවෙන්, වික්ටෝරියා ප්‍රාන්තයේ සියළුම සංක්‍රමණ වෛද්‍ය පරීක්ෂණ තාවකාලිකව නවත්වා ඇත. වැඩිදුර මහජන සෞඛ්‍යය නිවේදනයන්ට අනුකූලව මෙම තීරණය සමලෝචනය කරනු ඇත.

# මා හට සංචාරක වීසා බලපත්‍රයක් හෝ ඉලෙක්ට්‍රොනික ගමන් අධිකාරියක් (Electronic Travel Authority (ETA)) ඇත

සංචාරක වීසා බලපත්‍ර සහ ETA මගින් ඕස්ට්‍රේලියාවේ තාවකාලිකව සිටීමට පමණක් අවස්ථාව ලබාදෙයි. ඔබට ඕස්ට්‍රේලියාවේ සිටීම කල නොහැකි නම්, හැකි අවස්ථාවල පිටත්ව යාමට කටයුතු කල යුතුය. ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාම සඳහා ගමන් කිරීම සම්බන්ධ බැහැර කිරීමකට අයදුම් කිරීමට අවශ්‍ය නැත.

ඔබගේ මව් රටට යාමට නොහැකිනම්, ඔබ විසින් වලංගු වීසා බලපත්‍රයක් තබා ගත යුතු අතර අවශ්‍ය අවස්ථාවල වෛද්‍ය උපදෙස් ලබාගත යුතුය.

## මාගේ වීසා බලපත්රය අවසන් වන දිනය පරීක්ෂා කර ගැනීම

අවසර දෙන ලද කාලසීමාව අවසානයේ ඔබ ඕස්ට්‍රේලියාවේ රැඳී සිටියහොත් ඔබගේ සංචාරක වීසා බලපත්‍රය හෝ ETA ස්වයංකී්‍රයව අවසානයට පත්වේ.

පහත ආකාරයට එය පරීක්ෂා කල හැකා:

- VEVO, myVEVO app, ඔබගේ වීසා ප්‍රදාන ලිපියේ හෝ ඔබගේ ImmiAccount මගින් ඔබගේ වීසා බලපත්‍ර තොරතුරු
- ඔබගේ ETA හි කල් ඉකුත්වන දිනය සහ කොන්දේසි, Check an ETA සේවාව මගින්.

**සටහන:** ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්වී ලොව වටා යන කෲස් නෞකා ගමනකින් පසු නැවත ඕස්ට්‍රේලියාවට පැමිණියේ නම්, කෲස් නෞකාවේ ඔබ ගතකල කාලය ඕස්ට්‍රේලියාවේ සිටි කාලය ලෙස ගණන් ගැනෙනු ඇත. එනම්, ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව ගිය ලෙස අප නොසලකනු ඇත. ලොව වටා යන කෲස් නෞකා ගමනක් මගින් ඔබ ඕස්ට්‍රේලියාවේ රැඳී සිටින කාලය නැවත ආරම්භ නොවේ. ඔබගේ කෲස් නෞකා ගමන ලොව වටා යන කෲස් නෞකා ගමනක්ද යන්න කෲස් නොකා මෙහෙයවන අයගෙන් අසා දැනගන්න.

## මාගේ වීසා බලපත්රයේ කාලය දීර්ඝ කිරීම

ඕස්ට්‍රේලියානු සංක්‍රමණ නීතිය යටතේ, සංචාරක වීසා බලපත්‍රයක් හෝ ETA බලපත්‍රයක කාලය දීර්ඝ කල නොහැක.

ඔබගේ වර්තමාන වීසා බලපත්‍රය අවසාන වීමට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

බොහෝ අවස්ථාවල, ඔබගේ වියදම් ඔබට කරගත හැකිනම්, ඔබ විසින් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීම සඳහා Visitor (tourist stream) වීසා බලපත්‍රයකට අයදුම් කල හැකිය. ඔබ දැනටමත් ඕස්ට්‍රේලියාව තුල සිට නව සංචාරක වීසා බලපත්‍රයකට අයදුම් කර ඇතිනම්, සංචාරක වීසා අයදුම් පත්‍ර සලකා බැලීම බලන්න.

ඔබගේ සංචාරක වීසා බලපත්‍රය අවසානයට පත්වේ නම්, සහ ඔබට නැවත මව්බිමට යාමට නොහැකිනම්, සහ වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුදුසුකම් නොමැතිනම්, ඔබ විසින් COVID-19 Pandemic event visa වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුදුසුකම් තිබිය හැකිය. ඔබ විසින් සංචාරක වීසා බලපත්‍රයක් ඇතුළුව වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුදුසුකම් නැති බව තහවුරු කල යුතුය. මේ අතරට වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීම සඳහා මුදල් නොමැති බව සඳහන් ප්‍රකාශයක් ඇතුලත් කල හැකිය.

ඔබගේ වෙනත් වීසා විකල්ප සොයා බැලීම කල හැකිය.

## නව වීසා බලපත්‍රයකට අයදුම් කිරීම

පහත ආකාරයට අයදුම් කරන ලෙසට අපි ඔබව උනන්දු කරමු:

- හැකි සෑම අවස්ථාවකම ImmiAccount ඔස්සේ
- දැනට ඇති වීසා බලපත්‍රය අවසාන වීමට සති 4 කට පෙර නොවනසේ.

ඔබ නව වීසා බලපත්‍රයකට අයදුම් කල පසු, ඔබගේ වීසා අයදුම්පත්‍රය සම්බන්ධව තීරණයක් ගනු ලබන තෙක් ඔබව ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව තබා ගැනීම සඳහා බ්‍රිජිං වීසා බලපත්‍රයක් ප්‍රදානය කරනු ඇත.

ඔබගේ වීසා බලපත්‍රයේ 'නව දුරටත් රැඳී සිටිය නොහැක යන කොන්දේසිය' (no further stay condition) ඇතිනම්, ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට පෙර මෙම කොන්දේසිය ඉවත් කිරීම සඳහා ඉල්ලීමක් කල යුතුය.

ඔබගේ වීසා බලපත්‍රය දැනටමත් අවසාන වී ඇතිනම්, මාගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී ඇත බලන්න.

## වැඩ කිරීම

සංචාරක සහ ETA වීසා බලපත්‍රධාරීන් හට ඕස්ට්‍රේලියාවේ වැඩ කිරීමට අවසර නැත.

## වීසා කොන්දේසි

කෝවිඩ්-19 ගමන් සීමා හේතුවෙන් සමහර ජාත්‍යන්තර ගමන් කරන අය හට සැලසුම් කල පරිදි ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාම වළක්වන අතර සිය වීසා කොන්දේසිවලට අනුව කටයුතු කිරීම කල නොහැකි බව දෙපාර්තමේන්තුව හඳුනා ගනී. අප ඔබගේ අනාගත වීසා අයදුම්පත්‍ර සලකා බැලීමේදී මෙය සලකා බලන අතර ඔබගේ පාලනයෙන් පරිබාහිර කරුණු හේතුවෙන් ඔබට එය බලපෑමක් නොවන බවට අපි වග බලා ගනිමු.

ඕස්ට්‍රේලියාවේ සංචාරක වීසා බලපත්‍රධාරීන් හට පහත වීසා කොන්දේසි අදාල විය හැකිය:

### වැඩිදුරටත් රැඳී සිටිය නොහැකි කොන්දේසිය (8503, 8534 සහ 8535 ඇතුලත්ය)

වැඩිදුරටත් රැඳී සිටිය නොහැකි වීසා කොන්දේසියක් ඇති වීසා බලපත්‍රයක් ඔබට ඇතිනම්, අදාල කොන්දේසිය ඉවත් නොකලලේ නම්, ඔබට ඕස්ට්‍රේලියාව තුල සිට බොහෝ වීසා බලපත්‍රවලට අයදුම් කල නොහැක.

ඔබ හට වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට අවශ්‍ය අතර ඔබගේ වීසා බලපත්‍රය සති හතරකට වඩා අඩු කාලයකදී අවසානවේ නම්, මෙම කොන්දේසිය ඉවත් කිරීම සඳහා ඉල්ලීමක් කල යුතුය.

ඔබගේ ඉල්ලීම අනුමත කලහොත්, ඔබගේ වර්තමනා වීසා බලපත්‍රය අවසාන වීමට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

## 8531 කොන්දේසිය (වීසා බලපයත්‍රය මගින් ලබාදුන් කාලයට ඔබ්බෙන් ඕස්ට්‍රේලියාවේ රැඳී නොසිටිය යුතුය)

මෙම කොන්දේසිය ඉවත් කල නොහැක. කෙසේවුවද, ඒ මගින් නව වීසා බලපත්‍රයකට අයදුම් කිරීම වළක්වන්නේ නැත.

ඔබ හට 8531 කොන්දේසිය ඇතුලත් වීසා බලපත්‍රයක් ඇතිනම්, ඔබගේ වර්තමාන වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

## 8558 කොන්දේසිය (ඕනෑම මාස 18ක කාල පරිච්ඡේදයකින් මාස 12කට වඩා කාලයක් ඕස්ට්‍රේලියාවේ සිටිය නොහැක)

මෙම කොන්දේසිය ඉවත් කල නොහැක. කෙසේවුවද, ඒ මගින් තව වීසා බලපත්‍රයකට අයදුම් කිරීම වළක්වන්නේ නැත.

ඔබ හට 8558 කොන්දේසිය ඇතුලත් වීසා බලපත්‍රයක් ඇතිනම්, ඔබගේ වර්තමාන වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

ඔබට අවසර දී ඇති කාලය අවසානයේ ඔබ ඕස්ට්‍රේලියාවේ රැඳී සිටියහොත් ස්වයංක්‍රීයවම ඔබගේ වීසා බලපත්‍රය අවසානයට පත්වනු ඇත.

මාස 18 ක කාලයක් ඇතුලත ඔබ මාස 12 ක් සමුච්ඡිතව ඕස්ට්‍රේලියාවේ සිටියේ නම් ඔබගේ වීසා බලපත්‍රය ස්වයංක්‍රීයව අවසානයට පත් නොවේ (ඔබට ලබාදී ඇති කාලය එක් ගමනකදී ඉක්මවා ගොස් නැතිනම්).

## වීසා බලපත්‍ර සලකා බැලීමේ වැඩපිළිවෙලවල්

කෝවිඩ්-19 හේතුවෙන් සමහර වීසා සලකා බැලීමේ කාලසීමාවන් හට බලපෑම් ඇතිවී ඇති අතර අයදුම්පත් සලකා බැලීම සඳහා වැඩි කාලයක් ගතවිය හැකිය.

ඔබ ඕස්ට්‍රේලියාවේ සිට සංචාරක වීසා බලපත්‍රයකට අයදුම් කල විට, ඔබට බ්‍රිජිං වීසා බලපත්‍රයක් ප්‍රදානය කරනු ඇත. ඔබගේ අයදුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර වර්තමාන වීසා බලපත්‍රය අවසානයට පත්වේ නම්, බ්‍රිජිං වීසා බලපත්‍රය ආරම්භ වනු ඇත. මේ මගින් ඔබ නීත්‍යානුකූලව රැඳී සිටින බවට තහවුරු කෙරේ.

ඔබගේ නව වීසා අයදුම්පත්‍රය අප විසින් සලකා බලන අතරතුර ඔබට ඕස්ට්‍රේලියාව තුල බ්‍රිජිං වීසා බලපත්‍රය මත රැඳී සිටිය හැකිය. ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍ර ප්‍රදාන දැන්වීම ලැබීම ප්‍රමාද විය හැකිය. ඔබගේ වර්තමාන වීසා බලපත්‍රය අවසානවීමට පෙර නව

සංචාරක වීසා බලපත්‍රයට අයදුම් කලේ නම්, අප විසින් ඔබගේ බ්‍රිජිං වීසා ප්‍රදාන දැන්වීම මෙතෙක් අප විසින් එවූයේ නැති වුවද, ඔබ කණස්සල්ලට පත්විය යුතු නැත.

අපට වැඩිදුර විස්තර අවශ්‍යනම් හෝ අප විසින් තීරණයක් ගත් පසු අප ඔබට දැනුම් දෙනු ඇත.

අප විසින් තීරණයක් ගැනීමට පෙර ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව ගියේ නම්, ඔබගේ වීසා අයදුම්පත්‍රය ඉල්ලා අස්කර ගත හැක.

අපගේ පණිවුඩ බැලීමට, ඔබගේ තොරතුරු යාවත්කාලීන කිරීමට, ඔබ විසින් වැරදි තොරතුරක් දී ඇතිනම් හෝ ඔබගේ අයදුම්පත්‍රය ඉල්ලා අස්කර ගැනීම සඳහා ඔබගේ ImmiAccount උපයෝගී කර ගන්න.

## සේවාවලට ඇතිවන බාධා

කෝවිඩ්-19 හේතුවෙන් වීසා අයදුම්පත්‍ර ක්‍රියාවලියට අදාල සමහර සේවාවලට බලපෑම් ඇතිවිය හැකි අතර අප විසින් උපයෝගී කරගනු ලබන සේවා බොහෝමයක් (වෛද්‍ය පරීක්ෂණ වැනි) කෙටි කාලීනව ලබාගත නොහැකි විය හැකිය. තත්වය මෙය වන අවස්ථාවල පරීක්ෂණ සම්පූර්ණ කිරීමට සහ ඉල්ලා සිටින ලද තොරතුරු සැපයීමට අමතර කාලය ලබාදෙනු ඇත.

## වැඩිදුර තොරතුරු සැපයීම

වැඩිදුර තොරතුරු සපයන ලෙසට ඔබගෙන් ඉල්ලීමක් කර ඇතිනම්, ඔබට හැකි විගස ඉල්ලා සිටින ලද තොරතුරු ImmiAccount  වෙතින් ලබා දෙන්න.

ලබාදුන් කාලසීමාව ඇතුලත අදාල තොරතුරු ලබාදිය නොහැකිනම්, පැහැදිලි කිරීමක් ImmiAccount වෙත එක් කරන්න. ඔබගේ වීසා අයදුම් පත්‍රය සලකා බැලීමේදී සේවාවලට සිදුවූ බාධා සැලකිල්ලට ගනු ඇත. ඔබගේ වීසා අයදුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර තවදුරටත් විස්තර අවශ්‍ය නම්, අප ඔබ හා සම්බන්ධ වනු ඇත.

## සෞඛ්‍යය පරීක්ෂණ සම්බන්ධ හමුවීමක් යොදා ගැනීම

ඔබගේ වීසා බලපත්‍රය සම්බන්ධයෙන් සෞඛ්‍යය පරීක්ෂණයකට යා යුතුනම්, අප ඒ බව ඔබට දැනුම් දෙනු ඇත. ලබාදී ඇති කාලසීමාව තුල බූපා මෙඩිකල් වීසා සර්විසස් (Bupa Medical Visa Services) සමඟ හමුවීමක් ලබාගත නොහැකි නම් හෝ ඔබගේ හමුව අවලංගු කර ඇතිනම්ඃ

- ඔබගේ ImmiAccount මගින් පැහැදිලි කිරීමක් අමුණන්න
- හැකි සෑම අවස්ථාවකම, මීලඟට ලබාගත හැකි දිනයට හමුවීමක් ලබා ගන්න
- ඔබ හමුවීමක් ලබාගත් පසු, ඔබගේ ImmiAccount ඔස්සේ ඔබ විසින් යොදාගත් හමුවීමේ දිනය අප හට දැනුම් දෙන්න.

ඔබගේ වීසා අයදුම් පත්‍රය සලකා බැලීමේදී හමුවීම් සම්බන්ධ ප්‍රමාද අප විසින් සැලකිල්ලට ගනු ඇත.  ඔබගේ වීසා අයදුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර තවදුරටත් විස්තර අවශ්‍ය නම්, අප ඔබ හා නැවත සම්බන්ධ වනු ඇත.

## කෝවිඩ්-19 වසංගත ඉසව් වීසා බලපත්‍රය (COVID-19 Pandemic event visa)

ඔබගේ ශිෂ්‍ය වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වන්නේ නම්, සහ ඔබට සිය මව්බිමට යාමට නොහැකිනම් සහ වෙනත් වීසා බලපත්‍රයකට අවශ්‍යතා සපුරන්නේ නැතිනම්, ඔබ Temporary Activity (Subclass 408) Australian Government Endorsed Event stream (COVID-19 Pandemic event visa) වීසා බලපත්‍රයකට සුදුසුකම් තිබිය හැකිය.

ඔබ හට වෙනත් වීසා බලපත්‍රයකට සුදුසුකම් නැති බව තහවුරු කල යුතුය. ඔබ හට වෙනත් වීසා බලපත්‍රයක් සඳහා අවශ්‍ය සුදුසුකම් නැත්තේ කුමන හේතුව නිසාද යන්න පෙන්වා දිය යුතුය. මෙයට ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට අවශ්‍ය ගාස්තුව සපයා ගැනීමට ප්‍රමාණවත් අරමුදල් නැති බවට බවට ප්‍රකාශයක් සහ සාක්ෂි තිබිය හැක.

ඔබ තවදුරටත රැඳී සිටිය නොහැක යන කොන්දේසියකට යටත් නම්, ඔබ විසින් කෝවිඩ්-19 වසංගත ඉසව් වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට පෙර එම කොන්දේසිය ඉවත්කර ගෙන සිටිය යුතුය.